# අංගුලිමාල දමණය



සංස්කරණය

**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.**



රන්වැට සහිත සිරිපා උඩමළුව

මුද්‍රණය - ගගන ප්‍රින්ටර්ස් - 0719 850 841

## පෙරවදන

### ''සතං සද්ධම්ම මඤ්ඤාය - සබ්බ දුක්ඛා පමුච්චතී''

කල්‍යාණ මිත්‍රයන්ගෙන් ධර්මය දැනගෙන සත්වයෝ සියලු දුකින් නිදහස් වෙති. බුදුරජාණන් වහන්සේ දෙවියන් අතර ඇතිවූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් මෙසේ දේශනා කරන ලදී. කෙනෙක් දුකට පත්වීමට හේතුව පෙර කර්ම විපාක අනුව පාපතර පුද්ගලයන් සමඟ එකතු වීමයි. හරියට කිරි වලට ගොම එකතු වීමක් වැනිය. කල්‍යාණ මිත්‍රයන් සමඟ එකතු වීම රත්තරං වලට රත්තරං එකතු වීම, සඳුන් වලට සඳුන් එකතුවීම වැනිය. අහිංසක අංගුලිමාල වීමත්, අංගුලිමාල රහත් වීමත් ඉහත ධර්මතාවය සනාථ කරන එක් කථාවකි. අංගුලිමාල දමනය ගැන විසිතුරු ග්‍රන්ථයක් සම්පාදනය කිරීමට 77 වැනි උපන් දිනය සිහිකරන පූජනීය අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේ සමත්වීම ගැන සියලු දෙනාට ආදර්ශයක් විය හැකිය. ගිහි අය වයසට යන විට සෑම අතින්ම දුබල වෙති. ශාසනික භික්ෂුව වයසට යන විට සෑම අතින්ම ප්‍රබල වෙති. රතනසාර හිමිද එසේ යැයි මම සිතමි. 77 වසරක් ගතවූයේ නමුත් උන්වහන්සේ අළුයම අවදිවීම, දිනකට තෙවරක් බුද්ධ වන්දනාව කිරීම, පිරිත් දේශනා, ධර්ම දේශනා, භාවනා කිරීම, බුද්ධ වර්ෂය කීම, තෙරුවන් උදෙසා මල් වට්ටි ගණනාවක් සකස් කිරීම, වත්පිළිවෙත් කිරීම, ප්‍රාතිමෝක්ෂය දේශනා කිරීම වැනි වයසක අය නොව ඇතැම් තරුණ අයවත් නොකරන පිංකම් රාශියක් කිරීමට සමත් වී ඇත. ඒ නිසාම උන්වහන්සේ බොහෝ මාරක අවස්ථා ජය ගෙන හොඳින් වැඩ සිටීම සතුටට කරුණකි. වයසට ගියේ ගත පමණයි, සිත නොවේ ඒ නිසා උන්වහන්සේ මේවන විට දහම් ග්‍රන්ථ 29 ක් පමණ සම්පාදනය කර තිබේ. හැබැයි උන්වහන්සේ මෙතෙක් දුර පැමිණියේ මල් ඇතුරූ පාරක නොවේ. නොයෙක් කරදර පීඩා ජයගෙන මඩ වගුරින් පිරුණු ලස්සන මලක් වගේ දැනට යෝගාශ්‍රම මධ්‍යස්ථානයේ නේවාසික හිමි නමක් වශයෙන් වැඩ සිටිති. උන්වහන්සේගේ ජීවිත ගමන තවත් අයෙක් ආදර්ශයට ගන්නේ නම් ඉතා මැනවි. වෛරය, පළිගැනීම දුරු කොට කරුණාව, මෛත්‍රිය, ඉවසීම වැනි සාර ධර්ම ඇති කර ගනිමින් මැරෙන ටික දවසට සියලු දෙනා සමඟිව හොඳින් සිටීම ඉතා වැදගත් අදිෂ්ඨානයකි.

**වසර 77 ක් 2017.07.29 වැනි දිනට සම්පූර්ණ කරමින් තම ජීවිතය ගැන අනුස්මරණය කරමින් උපන් දිනය වෙනුවෙන් වටිනා ධර්ම දානයක් සිදු කරමින් මෙම ''අංගුලිමාල දමනය'' නැමැති ග්‍රන්ථය මනහර ලෙස සම්පාදනය කල පූජ්‍ය අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේට 77 වසරක් නොව 120 වසරක් නමුත් නිදුක් නිරෝගී සුව ඇතිව පාරමී පුරා ගැනීමට සියලු ආකාරයෙන් ආරක්ෂාව, සෙත ශාන්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමි. සුභ උපන් දිනයක් වේවා ! හැදූ වැඩූ මව් දෙමව්පියන් ප්‍රධාන ඥාති මිත්‍රාදීන්ටත් අපවත් වී වදාළ ආචාර්ය ගුරු උපාධ්‍යායන් වහන්සේලාටත්, මිය ගිය සියලු ඥාතීන්ටත් අමා මහ නිවන් සුව ලැබේවා ! දැනට උන්වහන්සේට අවවාද අනුශාසනා ලබාදෙන අතිපූජනීය ත්‍රිපිටක විශාරද කහගොල්ලේ සෝමවංස ස්වාමීන් වහන්සේ ප්‍රධන මහා සඟ රුවනට පාරමිතාවක් වේවා ! ධර්මදානය වශයෙන් මේ සඳහා කාලය, ධනය, ශ්‍රමය වැය කල සියලු දෙනාටත් මුද්‍රණාලාධිපතිතුමා ප්‍රධාන කාර්ය මණ්ඩලයටත් සියලු ලෝකවාසී සත්වයන්ටත් සසර දුක් තරණයෙන් ලබන අමා මහ නිවන් සුව පිනිස වේවා !**

**සියලු දෙනා ලොව සුවපත් වේවා !**

**මෙයට,**
**මෙතැති,**
**ලග්ගල කල්‍යාණවංස හිමි,**
**ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රමය,**
**ගල්දූව - කහව,**
**අම්බලන්ගොඩ.**
**2017.07.25 දින**

# අංගුලිමාල දමණය

## අංක : 29

*සංස්කරණය*

**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.**

**නමො තසස භගවතො අරහතො සමමා සමබුඬසස !!!**

**ඒ භාග්‍යවත් අර්හත් ගෞතම සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!**

**ඒ අපගේ ගෞතම සම්බුද්ධ රජාණන් වහන්සේටත් ගුරුවූ නොනිමි අවුරුදු පන්දහසක් කල් සම්බුද්ධ ශාසනය පවත්වාගෙන යන ශ්‍රී ධර්මස්කන්ධයට මාගේ නමස්කාරය වේවා!!**

**එම සම්බුද්ධ ශාසනය පරපුරෙන් පරපුරට ආරක්ෂා කරගෙන යන්නාවූ පළමුවන ධර්ම සංඝායනයෙහි පටන් මතු අනාගතය දක්වා අතීත, වර්තමාන, අනාගත සඟ පරපුරට මාගේ නමස්කාරය වේවා!!!**

**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි,**
**ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රමය,**
**ගල්දූව, අම්බලන්ගොඩ.**
**03.06.2008**

**ඉතිපිසො භගවා අරහං සමමා සම්බුද්ධො විජ්ජාචරණ සමපනෙනා සුගතො ලොකවිදූ අනුත්තරො පුරිස ධමම සාරති සත්ථා දෙව මනුස්සාණං බුද්ධො භගවාති.**

මෙම ගාථා පාඨයට කැපී පෙනෙන වචනයක් ඇතුලත් කලේ දරුණු අති භයංකාර පුද්ගලයන් දෙදෙනෙක් කරුණා මෛත්‍රියෙන් දමනය කර ඔවුන් දෙදෙනා යහපත් මාර්ගයට යොමු කරපු නිසායි. ඉතිපිසො ගාථාවට ඇතුලත් කර තිබෙන එම වචනයේ අනුසාරයෙන් මෙම දහම් ග්‍රන්තය සකස් කරමි.

එක් සමයෙක්හි සර්වඥයන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි ජේතවන නම් අනාත පිංඩික සිටිතුමා විසින් පූජා කරන ලද ආරාමයෙහි වැඩ වසන සේක. එම පෙදෙසට අධිපති පසෙනදි කොසොල් රජතුමාගේ පාලන පෙදෙසෙහි අංගුලිමාල නමින් ඉතා බියකරු දරුණු මිනීමරුවෙක් වාසය කරයි. එම මිනීමරුවාගේ දක්‍ෂකම සහ බුද්ධිය දන්නා ගුරැවරයා ඔහු මැරවීමට උපක්‍රමයක් වශයෙන් ටික දෙනෙකු මරා ඇඟිළිගෙන ඒමට නියම කලොත් එය ඉෂ්ටවන බව දන්නා නිසා ගුරුපඬුරු වශයෙන් මිනිසුන් දහසක් මරා එක මිනිසකුගේ එක ඇඟිල්ල බැගින් කපා එකතුකර මාවෙත ගෙන එන්නැයි කියා උපදෙස් දුන්නිසා මොහු මෙසේ මිනීමරුවෙක් බවට පත්විය.

ඇඟිළි දහසක් නිසා ඔහුට හමුවන සෑම දෙනෙක්ම ස්ත්‍රී, පුරුෂ, බාල, මහළු භේදයක් නොමැතිව මර මරා ඇඟිළි මාලයක් සේ සාදා බෙල්ලේ එල්ලා සිටි,

එදින අපගේ භාග්‍යවත් අභීත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ මහා කරුණා සමාපත්තියෙන් සමවැදී අද මා කාහට පිහිට වන්නේදැයි ලෝකය දෙස බලා වදාරණ සේක්, මෙම නිර්දෝෂී පුද්ගලයාට මාර්ගඵල ලැබීමට තිබෙන හේතු වාසනාවත් එදින තමාගේ මව මරා ඇඟිළි දහස සම්පූර්ණ කරගන්නා බවත් එසේ කලොත් අප්‍රමාණ කාලයකට අවීචිමහ නිරයෙහ බලවත් දුක්විඳීමට සිදුවන බවත් දැන මොහුට පිහිට වෙමියි සිතා ඉදිරියෙන් එන මෑණියන්ට ඉදිරියෙන් එම මිනිමරුවාට පෙණෙන ලෙස මාර්ගයේ වැඩි සේක. මෙසේ මාර්ගයේ සන්සුන් ගමනින් වඩිනා බුදුරජාණන් වහන්සේ දුටු අඟුල්මල් මහත්සේ සතුටට පත්ව මා සිටින දිසාවට 10 ක්, 20 ක්, 30 ක්, 40 ක් ආවත් එකෙදු නිරුපද්‍රිතව ආපසු ගියේ



නෑ, ගුරු දේවයන්ගේ පූජාව ඉටුකිරීමට තව මට උවමනා කරන්නේ එක ඇඟිල්ලක් පමණයි. ඉන්පසු මා නිදහස් යයි සිතා කඩුව අමෝරා පසු පසින් ආවේය

කොපමණ වේගයෙන් ආවත් බුදුරජාණන් වහන්සේ අසලට ඒමට නොහැකිව මහත් වෙහෙස මහන්සියෙන්ද, දැඩි කෝපයෙන්ද යුතුව හිටු මහණ, හිටු කියා කෑ ගැසුවේය. එවිට තථාගතයන් වහන්සේ මහත් කරුණාවෙන් යුතුව දරුව මා නැවතී සිටින්නේ, තොපත් නවතින්නැයි මහත් කරුණාවෙන් යුතුව ඉල්ලා සිටි සේක.  එවිට අඟුල්මල් තෙම මින්පෙර මම දුවන රථද, අශ්වයින්ද, මුවන්ද දිවගොස් අල්ලා ගතිමි. ඒනමුත් මෙම මහණ කිසිත් බියක් සැකක් නැතිව මට නොහැඟෙන සේ වේගයෙන් යමින් බොරු කියයි. භගවත් ශ්‍රමණයෝ බොරු නොකියති. එහෙත් මෙම ශ්‍රමණයෝ මට බොරු කියමින් ගමන් කරණ හේතුව විමසිය යුතුයයි සිතා භගවත් ගෞතම තොප යමින් සියටිදී මම නැවතුනෙමි. මම නැවතී සිටියදී නවතින්න කියන්නේ ඇයිදැයි ඇසීය. එවිට තථාගතයන් වහන්සේ මෙසේ වදාළ සේක.

අඟුල්මල මම සැමදා බොරු නොකියමි. සංසාර ගමන මා විසින් නතර කළ බැවින් නැවතුන බව කියමි. දුක් සහිතවූද භයංකාරවූද නොනිම් සසර ගමන තථාගත තෙමේ නතර කළෙමි ඔබ සසරේ අනාථව තවම ගමන් කරයි. දේව මිනිසුන් විසින් පූජිත මෙ මහර්ෂි මහණ තෙම බොහෝ කාලයකට පසු මාගේ හිත සුව සැප පිණිස මා සිටින වනයට වැඩියේය. මම ඔබ වහන්සේගේ කථාව අසා මින් ඉදිරියට පවු නොකරමි, යි කියා කඩුව, දුන්න, ඊය, ඇඟිළිබැඳි මාලය පසෙකට දමා බුදුරජාණන් වහන්සේගේ ඉදිරියේ නාලාගිරි ඇත් රජු මෙන් නළල බිමතබා වැඳ සමාව යදිමින් ස්වාමීනී මට අනුකම්පා කළ මැනව මම මෙතැන් මෙවේලේ පටන් ප්‍රාණඝාත නොකරමි, මම අහිංසකයෙක්මි මාගේ ගුරුදේවයන් වහන්සේ මගෙන් ඉල්ලා සිටියේ මෙවන් ගුරු පඬුරකි. එවිට මම බැගෑපත්ව ඉල්ලා සිටියේ ගුරුපඬුරු වශයෙන් මාගේ හිසගසා දමැන්න, යි එය ප්‍රතික්ෂේප කල නිසයි මෙවන් පිළිකුල්

දෙයකට මම යොමු වූයේ. එනිසා මම නැවතද සමාව යදිමි, මෙවේලේ පටන් බුදුපියාණන් වහන්සේගේ කීකරු ශිෂ්‍යයකු වෙමි. මම බුදුසරණ යමි, මා සීලයෙහි පිහිටුවන සේක්වා,යි අයැද සිටියේය. එවිට භාග්‍යවත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අමුතුවෙන් දෙන සමාවක් නැති නිසා මොහුගේ හේතු සම්පත් දැක දකුණු ශ්‍රී හස්තය සිවුරුපටින් පිටතට ගෙන ඔහු දෙසට දිගුකර ''මෙහි එව භික්ඛුව'' යන වචන මාත්‍රය පිටවීමත් සමඟ ලේ පැල්ලම්වලින් පිරී තිබුණ ඇඳුම් සහ ශරීරය වෙනුවට සැටවයස් පිරුණු පැවිදි වස්ත්‍රයෙන් බිම බලාගත් දෑස් ඇතිව සර්වඥයන් වහන්සේගේ ශ්‍රී පාමුල නැවතත් වැඳවැටී සමාව ගෙන පසුපස ගමණින් සැවැත්නුවර ජේතවනාරාමය වෙත වැඩිය සේක.

මේ අතර රට වැසියා රජමැදුර වටකොට කොසොල් රජතුමාට මෙසේ කීවේය. '' මහ රජතුමනි, ඔබ වහඵන්සේගේ රාජ්‍යයෙහි මෙවන් භයානක අපරාධ කරන මිනීමරුවකු නිසා කිසිවෙකුට සැනසිල්ලේ සිටීමට නොහැකි තත්වයක් තිබියදී මෙයට ක්‍රියාමාර්ගයක් නොගන්නේ ඇයිද?'' යි ප්‍රශ්න කල අවස්ථාවේ ජනයා අස්වසමින් හැකි ඉක්මණින් එම මිනීමරුවා පණපිටින් හෝ මරා හෝ අත්අඩංගුවට ගන්නා බවත් එතෙක් ඉවසීමෙන් සිටින ලෙසත් දන්වා ජනයා පිටත් කරයවා අස්වයන් පන්සියයකින් සමන්විත සේනාවක් සමඟ එම අගුල්මල් මිනීමරු සිටින වනය වටලෑමට යාමේදී අතරමඟ ජේතවනාරාමයට ගොස් බුදු සිරිපා වැඳ යායුතුයි සිතා රථයෙන් යා හැකි දුරගොස් භාග්‍යවතුන් වහන්සේ වැඩ ස්ථානයට ගොස් වැඳ එකත් පස්ව සිටියේය

එසේ සිටි රජතුමා අමතා බුදුරජාණන් වහන්සේ ''මහරජතුමනි, ඔබට මහඩෙශ්වරවූ සේනා බල ඇති බිම්බිසාර රජතුමා කොපවුනාද? විසල්පුර ලිච්ඡවිහූ කොපවුනාද? එසේ නැත්නම් වෙනත් රාජ්‍ය උවදුරුක්ද?

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මෙහි සඳහන් කිසිවෙක් මා සමඟ කසිම අමනාපයක් නැත. එනමුත් මාගේ විජිතයෙහි අංගුලිමාල නමින්



දරුණු මිනීමරුවෙක් සිටින නිසා මාගේ රටවැසියා මහත් භීතියට පත්ව අසරණව දුටු දුටුවන් මරමින් මළවුන්ගේ ඇඟිළි කපා මාලයක් සේ සාදා ගෙල පැළඳ සැරිසරණ එම භයානක පුද්ගලයා අල්ලා ගැනීම සඳහා සේනාව සමඟ ඔහු සිටින වනයට යන අතරමඟදී ඔබ වහන්සේ හමුවී යාම සඳහා විහාරයට පැමිණියෙමි'' යි කීහ.

''එසේනම් මහ රජතුමනි ඔබ ඔය කියන පුද්ගලයා සියළුම පාපකර්මයන්ගෙන් වැළකී කෙස් රැවුල් බා කෂාවත් හැඳ පොරොව එක්වේලෙ අහර වළඳමින් භාවනාවේ යෙදී මෛත්‍රී වඩමින් සිටිනු දුටුවොත් ඔහුට කුමක් කරන්නෙහිද?'' අසා සිටිසේක.

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස. එසේ සිටිනු දක්නට ලැබුනොත් වැඳ නමස්කාර කරමි. ආසන පනවා පා දෝවා වැඩ සිටින්නට සලස්වමි. සේනාසන ගිලන්පස, බෙහෙත් ආදියෙන් පූජා කරමි. ආවාස පූජා කර ආරක්‍ෂාවද සපයමි. ස්වාමීන් වහන්ස, එවන් පවිටු දරුණු මිනීමරුවෙකුට එවන් ශීල සම්පත්තියක් කෙසේ ලබම්ද ? එම අවස්ථාව වන විට අඟුල්මල් තෙරණුවෝ බුදුරජාණන් වහන්සේ අසලම වැඩසිටි සේක. රජතුමාට එවිට අඟුල්මල් තෙරණුවෝ පෙන්වූ සේක. එම දර්ෂණයත් සමඟ කොසොල් රජතුමාගේ ඇඟ ලොමුඩැහැ ගැන්වින. දාඩිය පිටවිය. අසහනයට පත්විය. එවිට බුදුරජාණන් වහන්සෝ රජතුමා අමතා '' මහරජතුමනි, බිය නොවන්න. මොහුගෙන් කිසිවෙකුට හිංසාවක්, පීඩාවක් නැත.'' ඉන්පසු රජතුමා සන්සුන් විය. ඉන්පසු රජතුමා තෙරුන් වෙතට ගොස් ඔබ වහන්සේ අංගුලිමාල තෙරුන් වහන්සේමදැයි විමසීය. ''එසේය මහරජතුමනි, මම අංගුලිමාල තෙරණුවෝ වෙමි'' යි කීහ. ඔබ වහන්සේගේ මවගේ පියාගේ නම් කෙසේද ? යි විමසීය. ''මහරජතුමනි පියාගේ නම ගර්ග, මවගේ නම මන්තානි නම් වෙති'', ස්වාමීනි ඔබ වහන්සේ මෙම ශාසනයෙහි පැවැත්ම සඳහා යෙදෙත්වා මම ඔබ වහන්සේට සේනාසන, සිව්රු පිරිකර, ගිලන්පසයෙන් උපස්ථාන කරමියි, කීවේය.

එවිට තෙරුන් වහන්සේ මෙසේ වදාළ සේක. ''රජතුමනි, මම ආරාණ්‍යයෙහි වාසය කරමි. පිංඩපාතයෙන් යැපෙමි. පාංසුකුලිකව වසමි. මාහට තුන් සිවුරු සම්පූර්ණයි ඔබතුමාට දීඝායු වේවා'' යි ප්‍රාර්ථනා කල සේක.

ඉන්පසු රජතුමා සර්වඥයන් වහන්සේ වෙත එළඹ එකත්පස්ව හිඳ මෙසේ පැවසීය. ''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මහත් පුදුමයකි. අද්භූතය, ස්වාමීන් වහන්ස, මෙතරම් චණ්ඩ දරුණු පුද්ගලයින් දමණය කරන ආකාරය මහත් ආශ්චර්යය, ස්වාමිනී, අපට යම්, යම් පුද්ගලයින් නීති පණවා හෝ දඬුවම් පමුණුවා හෝ දමණය කළ නොහැක. ඔබ වහන්සේ එවන් කිසිම දඬුවමක් නොදී මෙවන් දරුණු පුද්ගලයින් දමණය කිරීම හත් විශ්මිත ක්‍රියාවකි. බුදුපියාණන් වහන්ස, ගිහි අපට බොහෝ කාර්ය ඇති නිසා යාමට අවසර දෙන සේක්වා'' අයැද නික්ම ගියේය.

එසඳ ආයුෂ්මත් අංගුලිමාල තෙරණුවෝ පෙරවරුයෙහි හැඳ පෙරව පාසිවුරුගෙන සැවැත්නුවර පිඬුසිඟා වැඩි සේක. ගෙපිළිවෙලින් පිඬු සිඟා වඩින අතර මඟදී එක් ගැබිණි කාන්තාවක් දරුවා ප්‍රසූති කරගත නොහැකිව මහත් වේදනාවෙන් හඬනු දැක මහත් සංවේගයෙන් යුතුව මෙසේ සිතන්නට විය. මෙම මහා දුක් සසර කෙළෙස් වලින් බරවූ සත්වයෝ විඳින දුක් කියා සිතමින් ගොස් පිණ්ඩපාත දානයෙන් පසු බුදුරජානන් වහන්සේ වෙත ගොස් වැඳ එකත්පස්ව සිට පින්ඩපාත චාරිකාවේදී දුටු සිද්දිය විස්තර කළ සේක. එවිට බුදුරජාණන් වහන්සේ විසින් එසේනම් තොප එමමාගම වෙත ගොස් මා උපන්දා පටන් දැන දැන මේ දක්වා ප්‍රාණ ඝාතයක් කර නැත. එම අනුහසින් නැගණියට සෙතෙක් වේවා, දරු ගැබට සෙතක් වේවා, යි ප්‍රාර්ථනා කරන ලෙස දන්වා වදාල සේක. ''ස්වාමීනී, එය මට මුසාවාදයක් වෙයි. මා විසින් දැන දැන බොහෝ ප්‍රාණඝාත අකුසල් කර තිබේ. එසේ තිබියදී මෙලෙස



කෙසේ සත්‍යක්‍රියා කරම්ද? '' යි අසා සිටිසේක.

අංගුලිමාලය, එසේ නම් තොප එමමාගම වෙත ගොස් මෙසේ කියව. ''නැගණියනි, මම යම් දවසක ආර්ය ජාතියෙහි උපන්නෙහිද (පැවිදි භාවය) එතැන් පටන් කොට දැන දැන සතකුගේ ජීවිතය විනාශ නොකෙලෙමි. එම සත්‍ය බලයෙන් නැගණියට සෙතක් වේවා, දරු ගැබට සෙතක් වේවා'' කියා සත්‍ය ක්‍රියා කල පසු නිදුක්ව නීරෝගිව දරු සම්පත බිහි කළහ.

ඉන්පසු තෙරුන් වහන්සේ විවේකී ස්ථානයකට වී වස්තුකාම, ක්ලෙශකාමයන් කෙරෙන් සිතින් කයින් පිළිකුල් කොට (කමටහන්හි) සිහි එලවා කෙළෙස් තවන වීර්ය ඇතිව නිවණට මෙහෙයවූ සිත් ඇතිව වාසය කරන්නාහු නොබෝ දිනකින්ම යම් රහත් භාවයක් සඳහා කුලපුත්‍රයෝ ගිහිගෙයින් නික්ම බුදුසසුනට එකතු වෙත්ද ඒ අනුත්තරවූ බ්‍රහ්මචර්යා පර්යවසාන සංඛ්‍යාත අර්හත්ඵලය ඉහත ආත්මයෙහිම තමා විසින් දැන ප්‍රත්‍යක්ෂ කොට උපයා වාසය කළහ. භවයේ නැවත ඉපදීමක් නැති රහත් භාවයට පත්ව රහතන් වහන්සේලා අතර තවත් රහතන් වහන්සේ නමක් බවට පත්වූ සේක.

ඉක්බිති ආයුෂ්මත් අගුල්මල් තෙරණුවෝ පෙරවරුයෙහි හැඳ පෙරව පාසිවුරු ගෙන සැවැත් නුවරට පිඬුසිඟා වැඩියහ. එසේ වඩින අතර එම තෙරණුවන් මිනීමරපු සමයෙහි මැරුම් කෑ උදවියගේ ඥාති මිත්‍රාදීන් මෙම තෙරුන් වහන්සේට ගල්මුල් ආදියෙන් ගසමින් බැණ වදිමින් යන යන මාර්ගය අවහිර කර ගල් පහරවල් වැදී ඔළුව පැලී තුවාල වී ලේ ශරීරය පුරාවට පෙරමින් සිවුරු පාත්‍රාදියද තම ලේ වලින් තෙමී බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි සේක. මෙසේ තම එකම ගැලවුම් කරුවාණන් වන සම්මා සම්බුදු රජාණන් වහන්සේ වෙත පැමිණෙන තෙරුන් දැක ඒ වෙතට වැඩවදාරා මෙසේ අවවාද දී වදාළ සේක.

''බ්‍රහ්මණය, තෙපි අධිවාසනා කරව (ඉවසීම) බ්‍රාහ්මණය, තෙපි අධිවාසනා කරව, තෙපි යම් කර්ම විපාකයක් නිසා වර්ෂ දහස්, ලක්‍ෂ, කෝටි, ප්‍රකෝටි ගණන් නිරයන්හි බලවත් දුක් විපාක විඳින්නේද? බ්‍රාහ්මණය තෙපි එම කර්ම විපාකය මෙම ආත්ම භාවයෙහිම විඳ අවසන් කරයි.'' කියා වදාළ සේක.

එසඳ ආයුෂ්මත් අංගුලිමාල තෙරුන් වහන්සේ වේදනාවෙන් විඳ දරාගෙන වැඩහිඳ ඵලසමවත් සුව විඳිමින් (එයින් නැගී) මෙසේ සතුටු වූ සේක. යමෙක් පළමුව ප්‍රමාදව සිට (පාප ක්‍රියාවල යෙදී) පසුව එය වැරදි ක්‍රියාවක් බව වටහාගෙන එම පහත් පාප ක්‍රියාවන්ගෙන් මිදී සියලු සත්වයන් කෙරෙහි මෛත්‍රී සිත පතුරවා ශීල සම්පත්තිය දියුණු කරගෙන වස්තුකාම, ක්ලෙෂකාමයන්හී ඇලීමක්, ගැලීමක් නොමැතිව භාවනායෝගීව වාසය කරත්ද ඔහු අඳුරු වලාවෙන් මිදුනු, පූර්ණ චන්ද්‍රයා සේ බැබලෙයි. මෙලොවත්, පරලොවත් ජයගනී.

යමෙකු විසින් කල පාපකර්ම කුසල් බලයෙන් යටපත්කර ගනිත්ද පූර්ණ චන්ද්‍ර මණ්ඩලය අකුසල් නැමති අඳුරු වලාවෙන් මිදී ලොව බබලවන්නා සේම  මෙලොව බබලවයි. බුදුසසුන බබලවයි.

යම් භික්‍ෂුවක් බුද්ධශාසනයෙහි ඒකාන්තයෙන් තිදොරින් සන්වරව වාසය කරත්ද, එම භික්‍ෂුව අග්‍ර හිම වලාවෙන් මිදුණු සඳමඬල සේ බබලයි.

මාගේ සතුරෝ චතුරාර්‍ය සත්‍ය ධර්මකථා අසත්වා, මාගේ සතුරෝ සම්බුද්ධ ශාසනයෙහි දියුණුව පතත්වා, ක්‍රියා කෙරෙත්වා, මාගේ සතුරෝ යම් සත්පුරුෂ උතුමාණන් වහන්සේ කෙරෙහි පැහැදේවා. එම උතුමාණන් වහන්සේ අනුව ගමන් කෙරෙත්වා, භජනය කෙරෙත්වා, ශීල සම්පත්තිය දියුණු කෙරෙත්වා.



මාගේ සතුරෝ ක්‍ෂාන්තිවාදය ඇති මෛත්‍රී ගුණ වර්ණනා කරන සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය නිතර නිතර අසත්වා එම ධර්මය පිළිපදිත්වා. එම ධර්මය පුරත්වා.

මාගේ සතුරෝ මාහට හිංසා පීඩා නොකෙරෙත්වා, අන් සත්වයන්ටද හිංසා පීඩා නොකෙරෙත්වා, පරම ක්‍ෂාන්ති සංඛ්‍යාත නිර්වාණයට පැමිණ ක්ලේශ කාමයන්හි යෙදී සිටින සත්වයින් එයින් මුදවත්වා, රකිත්වා, ධර්මය ඔවුන්ට පහදා දෙත්වා.

ජලයෙන් ප්‍රයෝජන ගන්නවුන් ජලය තම අභිමතසේ පාලනය කරති. අවශ්‍ය තැනට උපක්‍රමයෙන් ගෙන යති. කම්මල් කරුවන් වානේ, යකඩ තම අභිමතසේ ප්‍රයෝජනයට ගනිති. දැව වඩුවෝ එම දැව තම අභිමතසේ නමති. පණ්ඩිතයෝ තම ආත්මය දමනය කර දුකෙන් මිදෙති.

රාජ්‍ය පාලකයෝ නිළදාරීහු දඬ ගැසීමෙන්ද, තර්ජනය කිරීමෙන්ද, බලපෑම් කිරීමෙන්ද, බොරුවෙන්, වංචා වෙන්ද, ආයුධයෙන්ද, හිරේ විලංගුවේ දමමින්ද, දමනය කරති. මම එය කිසිත් නැති මෛත්‍රී බලයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් දමනය කර වදාළ සේක.

පෙර අහිංසකව සිට මම හිංසයකු වීමි. හිංසකයකු වූ මම නැවත ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් කිසි බලපෑමක් නොමැතිව සත්‍යවූ අහිංසකයකු වෙමි. මා කිසිවෙක් නොපෙළමි.

පෙර මම අංගුලිමාල නමින් දරුණු මිනීමරුවෙකුව සිටියෙමි. අවිද්‍යාව නමැති මඩ හොරේ වැටී සිටියෙමි. සම්මා සම්බුදු රජාණන් වහන්සේ එයින් මා ගොඩට ගත්තේය. මම බුදුසරණ යමි.

**පෙර මම අංගුලිමාල නම් මිනීමරුවෙක්ව සිටියෙමි. සරණාගමනයේ බලය බලව මා විසින් සියලුම සංසාර බැඳීම් වලින් මිදුනෙමි.**

**දුගතියට යාමට බොහෝ පාපක්‍රියාවන්හි යෙදී සිටි මම නුවණින් එය අවබෝධ කරගත් නිසා කර්ම විපාක සංඛ්‍යාත මාර්ගචේතනා විසින් පහස්නා ලදුයෙමි. කෙළෙස් ක්‍ෂය නැතිව භෝජනය වළඳමි.**

**පව පිණ අවබෝධ කර ගැනීමට තීරණය කරගැනීමට නුවණක්, බුද්ධියක් නැති මෝඩ සත්වයින් ප්‍රමාදයට පත්ව පසුව පශ්චාත්තාපවී අපාගාමී වෙති. එහෙත් ඥානවන්තයා අප්‍රමාදය ශ්‍රේෂ්ඨ වස්තුවක් සේ ආරක්‍ෂා කරගනී.**

**මා මෙම සම්බුඬ ශාසනයට ඇතුලත්වීම යහපත් ක්‍රියාවක් මිස නොමනා ක්‍රියාවක් නොවෙයි. ආත්මාර්ථකාමීව ශාසනයට එකතුවීමේ සිතුවිල්ලක්ද නොවූ නිසා මෙම සම්බුඬ ශසනයෙන් ලද හැකි (ධර්මයෙන්) ශ්‍රේෂ්ඨ නිර්මාණයක් ඇත්ද එය මම ලබා ගතිමි. මම මාරයාගෙන් මිදුනෙමි. සියලුම අපාදොරවු සර්වඥයන් වහන්සේ නිසා මා හට වැසුනේය. සියලුම සංසාර බන්ධන වලින් මිදුනෙමි. සියලු සත්වයෝ මෙය ආදර්ශයට ගනිත්වා ! සියලු  පාප ක්‍රියා වලින් මිදෙත්වා !! කුසල් ක්‍රියාවන්හි යෙදෙත්වා !!!**

**සාධූ ! සාධූ !! සාධූ !!!**

**නිමි.**



# පසුවදන

**අනෙකෙහි ගුණොසෙහි - සබ්බසත්තු ත්තමො අහු**
**අනෙකෙහි උපායෙහි - නරදමෙම දමෙසිව**

ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ශීලාදී අනෙක ගුණෝඝයන් කරණ කොට සකල සත්වයන්ටම උත්තමවූ සේක. අනෙක කෝපයෙන් අදම්‍ය පුද්ගලයන් දමනය කළ සේක.

විචිකිච්ඡාව නීවරණයකි. (නිවණට බාධාවකි) හමුවන සෑම ස්ත්‍රී පුරුෂ ළමා ළපටින් පවා මරා දමමින් එක් අයකුගෙන් එක ඇඟිල්ලක් පමණක් කපාගෙන ඇඟිලි දහස සම්පූර්ණ වන දිනයේදී උදේ කඩුව මුවහත් තැබුවේ අද මාගේ මෑණියෝ හමුවූවත් ඇයව හෝ මරා ඇඟිලි දහස සම්පූර්ණ කර ගුරු පඬුරෙන් නිදහස් වෙමියි සිතායි. එහෙත් අද දින අවාසනාව යටපත්වී වාසනාව උදාවියි.

බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා මහා කරුණාවෙන් පාන්දර අළුයම් වේලෙහි (බ්‍රහ්මපාදය) ලෝකය දෙස බලන්නේ අද මම කාටද පිහිට වන්නේ, මාර්ගඵලයට ගතහැකි කෙනෙක් නම් විශේෂයි. එසේ නොවේ නම් නිරයගාමී වන පුද්ගලයින් එයින් මිදවීමයි. අරමුණ එයින් බුදුරජාණන් වහන්සේලා විශේෂයි. එදා අංගුල්මාලට පඤ්චානන්තරි පාපකර්මය කරගෙන එක දිගට මහා කල්පයක් අටමහ නරකයන්ගෙන් දරුණුම අපාය වන අවීචිමහ නිරයගාමීව සසරෙන් මිදෙනතාක් කල් මුගලන් මහරහතන් වහන්සේට වගේම උප උපන් ආත්මයක් පාසාම අකල් මරණයන්ට ගොදුරු වීමට තිබුණු අවස්ථාව වළකා කරගත් අකුසල කර්ම විපාක එම ආත්මයෙන්ම ගෙවා සදාකල් ජාතියක්, ජරාවක්, ව්‍යාදියක්, මරණයක් නැති නිර්වාණ සම්පත්තිය ලබාගත්තේය.

එයට හේතුව කුමක්ද? දරුව මා නැවතී සිටින්නේ, තොපත් නවතින්න එවන් කෙටි වචන මාලාවකට එතරම් බල සම්පන්න මිනීමරු පුද්ගලයෙක් කෙසේ දමණය වේද? ඉස්මතුවී තිබ්ණු අකුශලය යටපත්වී, යටපත්වී තිබුණු කුශලය ඉස්මතුවීමයි. එය මෙසේයි ඃ- අනෙකුත් ශිෂ්‍යයන්ගේ කේලම් අසා එම අහිංසක දරුවාගෙන් පලිගැනීමේ චෙතනාවෙන් යුතුව ඉල්වූ ගරු පඬුර වෙනුවට තමා මරා දමන්න කීවත් එය පිළි නොගෙන අනුන්ලවා මරවා දැමීමට එතරම් බිලි පූජාවක් ඉල්ලීමත් හේතු වාසනාවක් වූවා සේම පෙර අප්‍රමාණ වාර ගණන්හි (සුත සෝම ජාතකය, ජයද්දිස ජාතකයන්හිදි) බෝසතාණන් වහන්සේගෙන් ලැබුණු පිහිටාධාර සහ බුදු පියාණන් වහන්සේගේ පාරමිතා බලත් එයට හේතුවාසනා විය. එසේම එම ආත්ම භවයන්හිදී පොරිසාදයා දසරාජ ධර්මයෙන් රාජ්‍ය කරන සිල්වත් භාවයට පත් කරපු පින් සහ තවත් විස්තර ඉහත සඳහන් ජාතක කථා වස්තු බැලීමෙන් අවබෝධ කරගත හැක.

බුදුරජාණන් වහන්සේ අංගුලිමාලගේ හේතු සම්පත් බලා ''මෙහි එව භික්ඛුව'' වදාළ සැණින් ලේ පැල්ලම් පිරි තිබුණු ඇඳුම් සහ ශරීරය වෙනුවට හැට වයස් පිරුණු ශ්‍රමණ සාරුප්පියෙන් පෙනී සිටීම ආදිය සහ සකල සත්වයාගේ හිතසුව පිණිස පහළවන බුදුරජාණන් වහන්සේ නමකගේ සම්බුද්ධ ශාසනයක් ඉදිරියට ගෙන ඒමට වන ධෛර්යත් සහ උන්වහන්සේගේ ප්‍රීති වාක්‍යයෙන්ම කියවී තිබෙනවා මා මෙම සම්බුඬ ශාසනයට ඇතුලුවීම යහපත් ක්‍රියාවක් මිස අයහපත් ක්‍රියාවක් නොවෙයි. ආත්මාර්ථකාමී වශයෙන් ඉදිරිපත් වූවා නොවෙයි කියා සහ ලෝකයා පුරා ප්‍රසිද්ධ වූ කොසොල් රජතුමාගේ අසදෘෂ දානයේදී දරුනුම චණ්ඩ හස්ති රාජයා පවන් සැලීම පිණිස යොමු කලේ අංගුලිමාල රහතන් වහන්සේ වෙතටම වීම.



එසේම බුදුදහම ඉගෙන ගත්ත, ගන්න ප්‍රතුණ කරන අයට වෙනත් ආකාරයකට මෙවන් සිතිවිල්ලක්ද උපදී. මව මරන්න එන අංගුලිමාල පෙනුනානම් ඔහුගෙන් මැරුම්කෑ දහසකට වැඩි පිරිසක් නොපෙණුනේ ඇයිද? සහ පියා නොයෙකුත් වධ හිංසා වලට ලක්කර මැරූ අජාසත් රජතුමා නොපෙණුනේ ඇයිද? යන්න එයට පිළිතුරු දෙන්නේත් තවත් කාරණයකට පිලිතුරු දීමටත් එක්කය. බොහෝ අයගේ මතයක් තිබෙනවා අජාසත් රජතුමා නිරයගාමී නොවූබව සහ නිරයගාමීවූ බව සහා දෙව්දත් තෙරුන් වහන්සේ වාගේම මේ කල්පය ගෙවන තෙක් අවීචිමහ නිරයෙහි දුක්විඳවන බව දෙව්දත්තර නිරයගාමී වීම ගැන දීර්ඝ විස්තරයක් ''මිලින්ද ප්‍රශ්නය'' නමැති දහම් ග්‍රන්තයට ඇතුලත්ව තිබේ. එය කියවා බලන්න. මේ සසර අපදින මැරෙන සත්වයන් ආශ්වාස, ප්‍රාශ්වාස කිරීමක් වැනි දෙයකි. සකල සත්වයා වෙනුවෙන් මහා කරුනාවෙන් අනන්ත දීර්ඝ කාලයක් කිව නොහැකි ඇඟ කිලිපොලා යන පාරමිතා පුරා බුදු බවට පත්වන්නේ අසංඛ්‍ය ගණන් සත්වයන්ගේ ඉතා අල්ප දෙනෙකි.

මෙහි මුලින් සඳහන් කර ඇති අන්දමට සසර ගමන නිමාකිරීමේ හේතුවාසනා තිබෙන සත්වයන් හෝ එසේ නොමැති නම් නිරයගාමී වන සත්වයන්ගේ වාසනාවකට තමයි දර්ශණ වන්නේ. එය මට්ඨකුණ්ඩලී කුඹුරේ වැඩ කරමින් සිටි ගොවියා (සපීයා) අනේපිඬු සිටුතුමාගේ ගව පාලකයා ආදී කථාවස්තු තවත් ඇත.

එසේම පසේ බුදුන් වහන්සේලාට අන්‍යයන්ට ධර්මාවබෝධය කිරීමට නොහැකි නිසා මතු පහළ වීමට ප්‍රාර්තනා කරගෙන එන බුදු, පසේබුදු, ශ්‍රාව, ශ්‍රාවිකාවන් වැනි අයට දීර්ඝ කාලවල් ගෙවන තෙක් දුගතිගාමී වීමෙන් වැළකීම පිණිස නොයෙකුත් ආකාරයෙන් පින් කරගැනීමට මාර්ගයන් සළසා දෙන්නේය.

එසේම අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලාත් මහා කරුනාවෙන් බුදු රජානන් වහන්සේ ආදර්ශයට ගෙන එම බ්‍රහ්මපාදයේ (අළුයම 4.30 සිට 6.0) ලෝකය දෙස බලපු නිසයි කාශ්‍යප මහරහතන් වහන්සේ ලාඳුරු රෝගියාගේ අතින් තම පාත්තරයට බෙදූ බත් ඔහුට පෙනෙන ලෙස ගසක් යට සිට වැළඳූ සේක. ඉන්දික දෙවියන් වූ අසරණ දුගියා අනුරුද්ධ මහ රහතන් වහන්සේට එදා දර්ශණය වූ නිසායි දුගතියෙන් මිදී තව්තිසා දෙව්ලොව මහේශාඛ්‍ය දෙවියෙක් වී ඉපදුනේ. තවත් එවන් විස්තර බණ පොත් වල ඕනෑතරම් සඳහන්ව ඇත.

අසේවනාච බාලානං - පණ්ඩිතානං ච සෙවනා
පූජා ච පූජනීයානං - එතං මඞගල මුත්තමං

දැන් පෙන්වීමට උත්සහ කරන්නේ අජාසත් රජතුමා ගැන විස්තරයයි ඃ- එය මෙසේයි. සැවොම දන්නවා අංගුලිමාල ඉතා පිලිකුලෙන් යුතුව භාරගත් ගුරු පඬුරක් බව, එපමණක්ද නොවෙයි තම මව මැරීමටවත් පියා මැරීමටවත් ඉදිරිපත් වූවා නොවෙයි. අනුන්ගේ කේලම් (ඊෂ්‍යාව) අසපු අඥාණ ගුරුවරයාගේ පළගැනීමේ චේතනාවෙන් එම අහිංසක කුමාරයාගෙන් ඉල්ලූ ණයක් ගෙවීමට වූ නිසා භාරගත් කාය්‍යයක් වීම නිසායි. එය අවසානය වන විට ඔහු දැඩි පීඩාවකට සහ අසහනයකට ලක්වී සිටීමත් නිසා ‘අද මගේ අම්මා මරා හෝ නයින් නිදහස් වෙමි’’ යි සිතා එතරම් දැඩි පීඩාවකට ලක්ව සිටීම.

## අසේවනා ච බාලානං

අජාසත් කුමාරයා සියළුම රාජ්‍ය සම්පත් විඳිමින් සිටියදී තම පියාවූ බිංබිසාර රජතුමා අසීමිත දරු සෙනෙහසකින් ඕනෑම අවස්ථාවක රජ්‍යය තම පුතාට භාරදීමට සූදානමෙන් සිටියත් මෙකුමරුගේ  උපන් වේලාවේ කේන්දරය අනුව ඔහු තම පියා  මරවන



බව දැන දැනත් ඔහුට කොතරම් දරු සෙනෙහස පෑවත් පාපී දෙව්දත් තෙරුන්ගේ ආශ්‍රය නිසා පඤ්චානංතරී පාප කර්මය කරගත්තේය. අජාසත්  කුමාරයාට කිසිවිටෙකත් මේ මාගේ ආදරණීය පියා නේද ? දෙව්දත්තර කවුද ? මොහු මාහට මෙවන් උපදෙසක් දෙන්නේ මොහු නපුරෙක් නේද කියා සිතන්න සිතක් පහළනූනම් ඔහු කාහට කෙසේ පෙනේද ?

## පණ්ඩිතානං ච සෙවනා

කෙසේ නමුත් දෙව්දත් තෙරුණ්ගේ සහ අජාසත් රජතුමාගේ ගිවිසුම අනුව අජාසත් කුමාරයා තම පියා මරාගත්තා රජකම ලබාගත්තා දෙව්දත් තෙරුන්ට බුදුරජානන් වහන්සේට එවන් දෙයක් කරගන්ටත් බැරි වුණා. බුඬ රාජ්‍ය ලබාගන්ටත් බැරි උනා මේ අතර අජාසත් රජතුමාට දරු සම්පතක් ලැබුණා දරුවා නාවා පිරිසිදු කර සේවිකාවෝ රජතුමා වෙත භාර දුන්නා එවිට අප්‍රමාණ පුත්‍ර සෙනෙහසක් ඇතිවී තම පියා නිදහස් කිරීමට අණකර ඔහුගේ මෑණියන් වෙත ගොස් ‘‘මෑණියනි, මම ඉපදුන වේලෙත් මගේ පියාත් (බිංබිසාර රජතුමා) මට මේ වගේ ආදරයෙන් වඩා ගත්තාද ? ’’ කියා ඇසුව වේලේ තොපගේ මොන දරු සෙනෙහසක්ද? එක් දිනක් රාජ සභාව රැස්වී කටයුතු කරමින් සිටින විට තොපගේ අතේ ඇඟිල්ලක දිය බිබිලක් හටගෙන එම වේදනාවෙන් තොප හඬනු ඇසී වහා එතනට දිව අවුත් එම ඇඟිල්ල තොපගේ පියාගේ කටේ දමා උරද්දී එය පිපිරී පියාගේ කටේ සැරව පිරී තිබියදීත් තොප කෙරෙහි තිබුණු දරු සෙනෙහස නිසා රාජ සභාව ඉදිරියේ තාත්තා හඬා වැළපුනා යයි කීහ.

මවගෙන් එය ඇසීමත් සමඟම අජාසත් රජතුමාගේ ඇගෙන් දාඩිය දමන්ට වන්හ. එවිටම තම පියාණන් නිදහස් කිරිමට යැවූ ඇමතියෝ මහරජතුමා මියගිය බව දැන්වූ පසු රජතුමා උම්මත්තකයෙක්

බවට පත්විය. සිතට කිසිම සැනසීමක් නැත. නින්ද යන්නේ නැත. මධ්‍යම රාත්‍රියටද ලන්විය. එක් එක් නිගන්ටයන් අදහපු ඇමතියෝ අජාසත් රජතුමාට යෝජනා කරනවා ඔවුනොවුන්ගේ සාස්තෘන් වෙත ගොස් සිත හදාගන්න එවිට රජතුමා පවසන්නේ ඔවුන් මොන සාස්තෘන්ද ඔවුන් මොනවාද දන්නේ කියමින් ඒ සැවොගේම අදහස් පිළිකෙව් කල පසු තව තවත් දාඩිය දමමින් මහත් අසහනයෙන් සිටිනු දූනගත් ජීවක වෛද්‍යතුමා රජතුමාට මෙසේ පැවසීය.

''මහරජතුමනි, ඔබ වහන්සේගේ අසහනය නිවාගැනීම සඳහා මේ අවස්ථාව වන විට මාගේ අඹ වනයේ බුදුරජාණන් වහන්සේ මහත් සංඝරත්නයක් සමඟ වැඩ සිටිනවා අපි එහි ගොස් බුදුරජානන් වහන්සේ හමුවෙමු'' යි යෝජනා කල විට රජතුමා තව තවත් අසහනයට පත්ව මම කෙසේනම් බුදුරජාණන් වහන්සේ වෙත යම්ද, බුදුරජාණන් වහන්සේට විරුද්ධව වැඩ කරන්න දෙව්දත් තෙරුන්ට කොපමණ උදව් උපකාර කලාද ? තොපගේ යෝජනාව මම තවත් අපහසුවට පත්කිරීමට කරන යෝජනාවක් කියා එයත් ප්‍රතික්ෂ්ප කරලීය. ජීවකතුමා එවිට බුදුරජාණන් වහන්සේගේ ගුණ වර්ණනා කරමින් කියා සිටියේ මම වෛද්‍යවරයෙක් මම කියන දෙයට එකඟ වන්න බුදුරජාණන් වහන්සේ ඔබතුමාට පිහිට වන බවට මම පොරොන්දු වෙමියි කී පසු එකඟ විය.

බොහෝ අපහසුතාවයෙන් රජතුමා කැමති කරවා ගෙන රථ වලින් යා හැකි දුර ගොස් වැඩ සිටින ස්ථානයට පයින් ගොස් බුදුරජානන් වහන්සේ වැඳ නමස්කාර කර එකත්පස්ව සිටියදී පලමුව රජතුමාට එම අවස්ථාවට අදාළ දම්දේශනාවක් කල පසු රජතුමා මෙසේ සිතුවේය. මම දෙව්දත් තෙරුන් සමඟ බුදුරජාණන් වහන්සේට විරුද්ධව බොහෝ ක්‍රියාකලත් ඒ කිසිවක් සඳහන් නොකර මාගේ සිත නිවෙන පිනිසම දේශනා කරන්නේ අනේ මම පව්ටෙක් ආශ්‍රය කිරිම නිසා මොනතරම් වරදක්ද මම කරගත්තේ අද මේ ජීවකතුමා නිසා මට



**බුදුරජාණන් වහන්සේ ළඟට එමේ භාග්‍ය උදාඋනා මම කොතරම් බියෙන්ද මෙතනට පැමිණියේ දූන් මොනතරම් සැනසීමක් මට ලැබුණාදූයි සිතා,**

**බුදුරජාණන් වහන්සේට නැවත වැඳ සමාව අයැද සිටියේය. බුදුරජානන් වහන්සේලාගේ අමුතුවෙන් දෙන සමාවක් නැති නිසා '' මහරජතුමනි, යමෙක් යම් වරදක්, අපරාධයක් කර එය පසුව මම කලේ වරදක් නැවතත් එවැනි වැරදි මාගෙන් සිදුවන්නේ නැතැයි තදින් සිතට ගෙන ක්‍රියා කලොත් ඔහු නිවරදි කෙනෙක් වෙයි. සිදුවූ වැරදි නැවත නැවත සිහිපත් කර පසුතැවිලිවීම ප්‍රමාදයක්'' යයි වදාල සේක. එවිට රජතුමා බුදුරජාණන් වහන්සේ කෙරෙහි මහත් පැහැදීමෙන් යුතුව ස්වාමීනි, බුදුරජානන් වහන්ස, ගිහියන් වූ අපට බොහෝ කාර්යයන් තිබෙන නිසා ආපසු යාමට අවසර ගෙන බුදුරජාණන් වහන්සේ වැඩ සිටි දිසාවට පිටු නොපා පසුපසට ගියේය.**

**එම ස්ථානයෙන් රජතුමා නික්ම ගිය පසු බුදුරජාණන් වහන්සේ සමඟ එක්ව සිටි බික්ෂූන් අමතා මෙසේ වදාළ සේක.**

**''මහණෙනි, මෙහි පැමිණි අජාතසත්‍ර රජතුමා පියා නොමැරුවානම් මාගේ එම ධම්දේශනාව අසා මෙහිම සෝවාන් ඵලයට පත්වන්නේය. යමෙක් පඤ්චානන්තරී පාප කම්යක් කලා නම් මරණාසන්න මොහොතේදී බුදුරජාණන් වහන්සේ නමකගේ සිව්රුපට අල්වාගෙන සිටියත් නිරයගාමී වීම වැලැක්විය නොහැකිය. එනමුත් මේ රජතුමාගෙන් මාගේ සාසනයට ඉදිරියේදී වන සේවයත් මා කෙරෙහි ඇතිවූ පැහැදීමත් නිසා මරණින් පසු අවීචිමහ නිරයේ ශාඛාවක් වූ පදුම නිරයෙහි අවුරුදු (30000) තිස්දහසක් මහත් දුක් විඳවා එයින් මිදී මිනිසත් ආත්ම භාවයක් ලබා පසේබුදුබවට පත්ව පිරිණිවන් පාන්නේයයි '' වදාළ සේක.**

දැන් මහා මංගලසූත්‍ර දේශනාවේ සඳහන් මංගල කාරණා තුන පැහැදිලි ඇතැයි සිතමි. **බාලයන් ඇසුරු කිරීම නිසා** නිරයගාමී වීම, **දස පුණ්‍ය ක්‍රියාවන්හි යෙදෙන අය ආශ්‍රය කිරීම නිසා** බුදුරජාණන් වහන්සේ වෙත යොමු වීම. **පූජාච පූජණීයං** පිදිය යුත්තන්ගේ ප්‍රධානියා වූ අප භාග්‍යවත් අභීත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ හමුවූ නිසා අවුරුදු වලින් කිව නොහැකි අවුරුදු කෝටි ප්‍රකෝටි ගණන් අපාදුක් විඳ එයින් මිදී මිනිසත් ආත්ම භාවයක් ලදත් මහා මුගලන් රහතන් වහන්සේට සේම අකුසල කර්‍ම ගෙවීම නිරයේ ඉතා සුළු කාලයක් විඳවා මනුලොව ඉපිද සම්පූර්ණයෙන්ම සංසාර දුක් ගමන නිමා කිරීම **අංගුලිමාල** රහතන් වහන්සේට එසේ නොවූයේ චේතනාව පිරිසිදු නිසා පාපී ග්‍රහණයට වැටුණත් පෙරතිබූ බලගතු පුණ්‍ය මහිමය නිසයි.

මීට, මෙතැති,
පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි,
071 7403900, 072 4609546
www.dahamnena.lk
29.07.2017
(හැත්තෑහත්වන උපන් දිනය)



# සම්පත් ගෙන දෙන කඨින පූජා

බෝ දුර සිට බුදු රැස් විහිදෙනවා
මී දුම සේ මෙත් සිසිල දැනෙනවා
පිදුණු සදහම් රස ඉතිරෙනවා
සාදු කඨින පෙරහර ඇරඹෙනවා

හේවිසි හඬ තාලෙට නැග එනවා
සේසත් ගෙන එක පෙළට හැදෙනවා
කඨින චීවරේ වැඩම කරනවා
දෝත නගා අපි සාදු කියනවා

ඉමිහිරි බුදු ගුණ සිතට දැනෙනවා
සුමිහිරි පිය වදනින් තෙපලනවා
දෙව් සිරි මිහිබට සේ දිස් වෙනවා
හිත පිරි සෙනෙහස පෙරට ඇදෙනවා

කොබොලීල මල් පෙළට පිපෙන් නේ
නබෝ ගැබෙන් සේසත් එසැවෙන් නේ
පබෝදයෙන් සිත් කුල්මත් වන් නේ
සුදෝ සුදට මේ පෙරහර යන් නේ

සංයත හැඟුමින් පිරි සඟ රුවනට
පින්බර දෝතින් සිවුර පිදීමට
ළං වන පෙරහරෙ සිරි නැරඹීමට
ළං වෙත දෙව්වරු දේව සබේ සිට

මෝහය වනසා සිද බිඳ දමලා
ආශා නැතිකොට වී සිහි නුමුලා
රාගා’දිය නැසූ සඟ ගුණ දැකලා
මේ චිවරෙ පුදනෙමු සෙත් පතලා

| | |
|---|---|
| කඨිනය පූජා කරන | වෙලාවට |
| වඩින මහ සඟ රුවන | දැකීමට |
| පැමිණි දනන් සිත් සතන් | නිවීමට |
| සැදුණු පිරිත් මණ්ඩපය පෙනේ | මට |
| | |
| නියඟය සිඳුනා මහ වැසි | වැටුණා |
| වැසි කාලය එළැඹුණු බව | පෙණුනා |
| වස්සානය යන නම | පටබැඳුණා |
| හිමිවරු අරමෙහි බවුනෙහි | යෙදුණා |
| | |
| වස් කල අරමෙහි වැඩ සිටි | හිමිවරු |
| දොස් නැති සිවුරක් ගෙනත් පුදන | තුරු |
| ගස් වී සිටිනා අරමට | පිවිතුරු |
| රැස් වෙමු පෙරහර කරමින් | විසිතුරු |
| | |
| පිරිකර දහසින් සඟුන් | පුදන්නට |
| පිරිත් පැනින් සෙත් සිසිල | විඳින්නට |
| කඨින චිවරය පිදෙන | වෙලාවට |
| අප හැම එක්වෙමු කප්රුක | අසලට |
| | |
| හැඩ වැඩ සුව පහසුව ද | නොවූවයි |
| කඩ කඩ එක්කොට සිවුරු | තැනූවයි |
| ''චීවර'' යන අරුතට | ගැලපූවයි |
| සසුනෙහි අරමුණ පැහැදිලි | වූවයි |
| | |
| හැමගේ දැතිනි සිවුර | මැසෙන්නේ |
| හැමගේ බැතිය යි එහි රොක් | වන්නේ |
| හැමගේ මැගුමයි ඉන් පල | දෙන්නේ |
| හැමටම එ පිනින් නිවන් | ලැබෙන්නේ |



| | |
|---|---|
| දුටුවන් සිත් කරවන | පැහැදීමක් |
| තෙර නමකට පිදදුවොත් | චිවරයක් |
| එයින් ලැබෙන කුසලට | පමාවක් |
| ලියන්ට පින්වත මට නැත | දැනුමක් |
| | |
| අට මහ කුසලින් මුල් තැන | ලැබගත් |
| කුසලය කිමෙකැ'යි විමසා | බැලුවොත් |
| කඨින පිදුම එයි මුලට ම | කවදත් |
| එය කළ යුතුමය නිරතුරු | සිහිපත් |
| | |
| දුලබ වූ පින්කම කඨින | පිදීම ය |
| නො සැලෙන පින්කම කඨින | පිදීම ය |
| බැබැලෙන පින්කම කඨින | පිදීම ය |
| නිවනට මාවත කඨින | පිදීම ය |
| | |
| මහමේරුව මහ පොළව ය | කියනා |
| දේ නො සැලෙන බව පවසනු | ඇසුනා |
| එය සැලුණත් මතු දින යම් | ලෙසිනා |
| නො සැපෙල් කඨිනයේ අනුසස් | නිතිනා |
| | |
| මහ වියනක් මැද සකසා | ගතයුතු |
| එක් දිනයක් තුළ පිළියෙල | කළයුතු |
| කඨින චිවරය ගැන අප | දතයුතු |
| දේ අපමණ ඇත සිහියට | ගතයුතු |
| | |
| සිවුමස ගිය කල හැම එක් වී | කළ |
| පින්කම් වල මුළු බලය ම කැටි | කළ |
| සවියක් රඳවා කුසලින් ඔප | කළ |
| මහ පින්කම මෙ වේ දෙන මහ | පළ |

| | |
|---|---|
| එක් වසරට එක් වරක් ම කළ | නිති |
| දෙ වරක් කරනට කිසිමැ ඉඩක් | නැති |
| කඨින සිවුරු පුද පින්කම බල | ඇති |
| දුබල මහා පින්කමැකි'යි | පවසති |
| | |
| ලොව ඇති හැම අයුරක මහ | පින්කම් |
| සියක් වසක් කෙරුවද බැඳ | රන්දම් |
| එක කඨිනයකින් ලැබෙන කුසල් | දම් |
| ඒ හැම පරදා ගෙනේ | උසස්කම් |
| | |
| තුලාවෙ වම් පස තමා නැඟී | ගෙන |
| දකුණු පසට රන් තබා කිරා | දෙන |
| 'තුලාභාර' දානයටත් නො | ලැබෙන |
| තැනක් ලැබේ කඨිනෙට හද | සනසන |
| | |
| ගිතෙල් ද මී සතුරු ද | වෙඬරු ද |
| තලතෙල් හැම සිය වසරක් කර | පුද |
| ලැබූ පිනට වැඩි පිනක් ලබන | ලද |
| අයෙක් කඨින පුද කළ අය හැම | සඳ |
| | |
| කඨිනයේ අනුසස් මහ බලගතු | වේ |
| සක් දෙව් පදවිය වුව ලද හැකි | වේ |
| 'නාගිත' තෙරිඳා එය | පැවසූවේ |
| එහි බල කිමට මය අප | හමුවේ |
| | |
| පැතිස්, අග්බෝ, පැරකුම් | ආදී |
| නිරවිරුවෝ පිදු ගුණ | අරහාදී |
| කඨින පුදා කළ මෙහෙයට | යාදී |
| තවමත් දෙව් ලොව පරසතු | පූදී |



| | |
|---|---|
| **සම්බුදු හිමිවරු සිදු කළ** | **පූජා** |
| **දම් බල මහිමය පෙන්වන** | **පූජා** |
| **තුම් සඟ රුවන ද නිති කළ** | **පූජා** |
| **අපිත් කරමු කඨිනෙට මහ** | **පූජා** |
| | |
| **සම්බුදු මඟ හැමට ම හෙළි** | **වේවා** |
| **ඒ මඟ සඟ රුවන්** | **වඩීවා** |
| **මහ සඟ රුවනට පූජා** | **වේවා** |
| **කඨිනයේ අනුසස් අපට** | **ලැබේවා** |
| | |
| **කඨින පූදා දෙව් ලොව** | **සැරිසරමු** |
| **කඨින පුදා සක් දෙව් බල** | **ලබමු** |
| **කඨින පුදා සක්විති සුව** | **විඳිමූ** |
| **කඨින පුදා හැම සම්පත්** | **ලබමූ** |

**1998.10.05 බුදුසරණ**
**සිරිල් හේවාවසම්**